# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2151/50 - 2019 නොවැම්බර් මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2019.11.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**(175 වැනි අධිකාරය වූ) වන්දනා ගමන් ආඥාපනත**

සාධාතුක කරඬුව සහිත ශ්‍රී සුමන සමන් දේව ප්‍රතිමාවහන්සේ ගෞතම ශ්‍රී පාදස්ථානය දක්වා වැඩම කරවීමේ
පෙරහැර 2019 - 2020

ලොව්තුරා බුද්ධත්වයෙන් වසර 8 කට පසු සබරගමුවේ පාලකව සිටි සුමන දෙව් මහ රජුගේ ඇරයුමෙන් සමන්තකූඨ පර්වත මස්ථකයේ ශ්‍රී පාද ලාංඡනය පිහිටුවා ශ්‍රී ලංකාව පාරිශුද්ධත්වයට පත්කර වදළ සේක. එතැන් සිට සමන්තකූඨ පර්වතය ලෝක පූජිත වූහ. එවක් පටන් රාජ රාජ මහාමාත්‍යාදීන් විසින් පුද පෙරහැර පවත්වති.

සබරගමු පළාතේ, රත්නපුර දිශාවේ නවදුන් කෝරලයේ පැල්මඩුල්ල කුට්ටාපිටිය විහාර ගමේ පිහිටි ගල්පොත්තාවෙල ශ්‍රී පාද රජමහ විහාරයේ අවාරයේ දී සුමන සමන් දේව ප්‍රතිමාවහන්සේ තැන්පත් කර පුදපූජා පවත්වන දේව මන්දිරය පිහිටා ඇත.

1. 2019 වසරේ උඳුවප් මස පුර පසළොස්වක පොහොය දිනට පෙර දින සධාතුක කරඬුන්වහන්සේ සහිත සමන් දේව ප්‍රතිමා වහන්සේ ගල්පොත්තාවෙල ශ්‍රී පාද රජමහ විහාරස්ථානයේ සිට සමන්තකූඨ පර්වත මස්ථකයට වැඩම කරවීමේ පෙරහැර මංගල්‍යය සුභ හෝරාවෙන් ආරම්භ කෙරේ.

    * 2019.12.09 දින පස්වරුවේ සිට 2019.12.10 දින අළුයම දක්වා දේව ප්‍රතිමා වහන්සේ නිරාවරණය කර බැතිමතුන්ගේ පුදපූජා පැවැත්වීම.

    * 2019.12.10 දින ගල්පොත්තාවෙල ශ්‍රී පාද රජමහා විහාරස්ථානයේ සිට අළුයම පෙරහැර ආරම්භ කිරීම.

I. 2019.12.10 දින පුද පූජා නිමාවීමෙන් පසු අළුයම ගල්පොත්තාවෙල ශ්‍රී පාද රජමහ විහාරස්ථානයේ සිට පැල්මඩුල්ල, රත්නපුර, කුරුවිට, ඇහැළියගොඩ, අවිස්සාවේල්ල, දෙහිඕවිට, කරවනැල්ල, යටියන්තොට, අඹගමුව, හැටන්, මස්කෙළිය නල්ලතන්නිය ආදී ප්‍රධාන නගර ඔස්සේ රිය පෙරහැර පැවැත්වීම.

II. 2019.12.10 දින අළුයම ගල්පොත්තාවෙල ශ්‍රී පාද රජමහ විහාරස්ථානයේ සිට පැල්මඩුලු නගරය, ගනේගම, පාතකඩ, සන්නස්ගම, දිප්පිටිගල, ලෙල්ලොපිටිය, වැලිමළුව, පතුල්පාන, පැල්වාඩිය, තිරිවානකැටිය, බටුගෙදර, වරකාතොට, කුඩුගල්වත්ත, නගර සභාව, ඔරලෝසු කණුව, ධර්මපාල මාවත, මොරගහයට, පානදුර පාර, ගල්කඩුව, සබරගමු මහ සමන් දේවාලයට ගොස් නැවත මොරගහයට, රෝහල් හන්දිය, වෙරළුපෙ හන්දිය නව නගරය, හිදැල්ලන විදුහල්



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මාවත, ෆාම් ගාඩ්න් හන්දිය නව නගරය, වෙරළුපෙ හන්දිය, මොරගහයට ෆර්ගසන් පාර, බස්නැවතුම්පොළ කුඩුගල්වත්ත, ගොඩිගමුව මල්වල, පාර ඔස්සේ ශ්‍රී පලාබත්ගල රජමහා විහාරස්ථානය දක්වා රිය පෙරහැර පැවැත්වීම හා පලාබත්ගල පෙරහැර සමග ගමන් කරන කුරුවිට එරත්න පෙරහැර ද, ගල්පොත්තවෙල ශ්‍රී පාද රජ මහා විහාරස්ථානයේ සිටම පැල්මඩුල්ල, ගනේගම. පාතකඩ, සන්නස්ගම, දිප්පිටිගල, ලෙල්ලොපිටිය, වැලිමළුව, පතුල්පාන, පැල්වාඩිය, තිරුවානාකැටිය, බටුගෙදර, වරකාතොට, කුඩුගල්වත්ත, නගරසභාව, ඔරලෝසු කණුව, අසලින් ධර්මපාල මාවත මොරගහයට, ගල්කඩුව, සමන් දේවාලයට ගොස් පුද පූජා පවත්වා, කහංගම හොලීපිටිය, ගොරක ඇළ හන්දියෙන් පහත්ගම හරහා කුරුවිට නගරයට කටුතියඹරාව, එක්නැලිගොඩ හරහා එරත්න පාරේ වර්ණගලට ගොස් පා ගමනින් පලාබත්ගල පෙරහැර පිටත් වීමෙන් පසු ගමන් කිරීම සිදුවේ.

III. 2019.12.10 දින අළුයම ගල්පොත්තාවෙල ශ්‍රී පාද රජමහ විහාරස්ථානයේ සිට පැල්මඩුල්ල නගරය, ඉද්දමල්ගොඩ, මීගහගොඩ, රඹුක බෝධිය, මොරතොට හන්දිය, හුණුවල, දෙල්ගස්ගාව, ඕපනායක, උඩවෙල, වෙළගේ, බලංගොඩට, ඇල්ලෙඅරාව මොරහැල, පින්නවල බොල්තුඹේ සමන් දේවාලයට ගොස් ආපසු මාරතැන්න හරහා බගවන්තලාව, නෝර්වුඩ් හැටන් හන්දිය මස්කෙළිය නල්ලතන්නිය දක්වා රිය පෙරහැර පැවැත්වීම.

අනතුරුව රජ මාවත ඔස්සේත්, හැටන් මාර්ගය ඔස්සේත්, ශ්‍රී පාද මළුව දක්වා සධාතුක කරඬුව සහිත සමන්දේව ප්‍රතිමා වහන්සේ දෝලාවෙන් සමන්තකූට පර්වතය දක්වා වැඩම වීමෙන් පෙරහැර මංගල්‍යය නිම කිරීමට නියමිතය.

* ශ්‍රී පාදස්ථානාධිපති නාහිමි නම්කරන රථ සඳහා පෙරහැරේ ප්‍රමුඛතාවය දිය යුතු අතර, පෙළගැස්මට බාධා නොවන ලෙස, පෙරහැරට සම්බන්ධ වන සෙසු රථ එයට පසුපසින් ගමන් කළ යුතු ය.

2. විහාරභූමිය තුළ වෙළඳාම් කිරීම තහනම් කරමි. ප්‍රධාන මාර්ගය හා ප්‍රධාන මාර්ගයේ සිට ශ්‍රී පාද විහාරය දක්වා අතුරු මාර්ගයේ වෙළඳාම් කිරීම හා දන්සැල් පැවැත්වීම, බැතිමතුන්ට හා පෙරහැරට බාධාවක් නොවන ලෙස කළ යුතු ය.

3. පැල්මඩුල්ල නගරයේ සිට ශ්‍රී පාද විහාරභූමිය තෙක් සම්මාදම් එකතු කිරීම, ආධාර එකතු කිරීම තහනම් කරමි.

4. ප්‍රධාන මාර්ගයේ සිට ශ්‍රී පාද විහාරභූමිය දක්වා මාර්ගයේ පෙරහැරට හා බැතිමතුන්ට අවහිර වන ලෙස පුද්ගලික රථවාහන නවතා තැබීම තහනම් කරමි.

5. විහාරභූමිය හා අවට මාර්ගයේ වීදි ලාම්පු හා අමතර ලාම්පු සවිකිරීම ලංකා විදුලිබල මණ්ඩලයට හා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට පවරමි.

6. පෙරහැර මංගල්‍යයට පෙර හා පසු සෞඛ්‍ය කටයුතු සනීපාරක්ෂක කටයුතු හා අපද්‍රව්‍ය ඉවත් කිරීම පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට පවරමි.

7. බැතිමතුන්ට අවශ්‍ය පානීය ජලය අමතර ජලටැංකි යොදා පහසුකම් සැපයීම ජල සම්පාදන මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයට පවරමි.

8. සියලු ආරක්ෂක කටයුතු පෙරහැරට හා බැතිමතුන්ට අවහිර නොවන ලෙස මාර්ගයේ රථවාහන හැසිරවීම ආරක්ෂක අංශ හා පොලීසිය වෙත පවරමි.

9. ශ්‍රී පාදස්ථානයේ මාස 6ක් වන්දනාමාන හා පුදපූජා පවත්වා ඉදිරියට එළඹෙන වෙසක් පොහොය දිනට පසු ගල්පොත්තාවෙල රජමහා විහාරස්ථානයේ මහා දේව මන්දිරයේ තැන්පත් කර පුදපූජා පවත්වනු ලබයි. එදින තෙක් උක්ත කරුණු 08ට අදළ නියෝග වලංගු වේ.

බී. එස්. ජී. රුවන්සිරි,
ප්‍රාදේශීය ලේකම්,
පැල්මඩුල්ල.

12 - 435

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.